NFX COMICS

Part I


THE FIRST SEAL

COLLECTOR'S ED.

YAKKA

The First Seal

Part I



DIRECT EDITION


00111 · NFX CREATIONS

CREATED & WRITTEN BY


Nawod Madhuwantha. aka Nawwa.4X

Prequel to YAKKA: The Last Bloodline · Part I: The Age of Guardians


රිටිගල වනාන්තරයේ රාත්‍රිය
කොළඹ යුද්ධය ඉවර වුණු එදා රෑ... රිටිගල කැලේ ගස් මුල් අතරින් වැටුණු පරණ ගල් පඩිපෙළ දිගේ තනි ගිනි පන්දමක් උඩට ඇදුණා.
THUD... CRACKLE...


නව්වා
"ඇයි මාවම තෝරගත්තේ?"
ගලේ කෙටූ යක්ෂ සොහොන් දොරටුව ඉස්සරහා, පොඩි ගිනි මැලයක් ගහගෙන හාමුදුරුවෝ හිටියේ හරියට අවුරුදු ගාණක් තිස්සේ එයා එනකම් බලාගෙන හිටියා වගේ.


FWOOSH!!
හාමුදුරුවෝ
"ඒක තේරුම් ගන්න නම් පුතේ... මම මේ කතාව මුල ඉඳලම කියන්න ඕනේ."


හාමුදුරුවන්ගේ හඬ
"රජවරු බිහිවෙන්නත් කලින්, එක වෙහෙරක්වත් හැදෙන්න කලින්... මේ දූපතේ ගෝත්‍ර හයක් එකට ජීවත් වුණා."



යක්ෂ ගෝත්‍රය
"උස කඳු මුදුන්වල බලකොටු හදාගෙන රට ආරක්ෂා කරපු යක්ෂ පරපුර..."


නාග ගෝත්‍රය
"...නිසල වැව් දියයි, ගංගා නගරයි පාලනය කරපු නාග රාජිනගේ පරපුර..."


දේව ගෝත්‍රය
"...මහා වනාන්තරේ යෝධ ගස් මුදුන්වල ඉඳන් දිලිසෙන ඊතල විදපු දේව දුනුවායෝ..."


රාක්ෂ ගෝත්‍රය
"...යකඩ කම්හල්වල ගිනි මෙහෙයවමින් අහසේ තරු ලකුණු කියවපු රාක්ෂ පරපුර."


යෝධ ගෝත්‍රය
"වල් අලි පවා දණහිස ගාවට විතරක් උසට පෙනුණු, මීදුමෙන් වැහුණු කඳුකරයේ යෝධයෝ..."


මිනිස් ගෝත්‍රය
"...ඒ වගේම මුහුදු වෙරළ දිගේ දැල් එළාගෙන ජීවත් වුණු සාමාන්‍ය මිනිස්සු."

අහසින් ආ සංඥාව
හැමදේම වෙනස් වුණේ එදා රෑ... දඩයක්කාරයාගේ තරු පන්තියේ තරු තුනක් අමුතුම රටාවකට නිවී නිවී පත්තු වෙන්න පටන් ගත්තා.



රජවරුන්ටත් කලින්. වෙහෙර විහාරවලටත් කලින්. ඉතිහාසයටත් කලින්.



කේතුමතී
"අහසේ තරු කතා කරනවා... කවුරුහරි ඈත ඉඳන් අපි දිහා බලාගෙන ඉන්නවා!"

මාර ආක්‍රමණය
එකපාරටම රෑ අහස ලේ පාටින් ඉරාගෙන කළු පාට යෝධ යානයක් උතුරු නැනිතලාවට කඩාගෙන වැටුණා, ඒ කම්පනයට මුළු කැලෑවම වීදුරු වගේ කුඩු වෙලා ගියා!

මාර පණිවිඩය
"සා'කාර් වෙල් තෝරුම්..."

KRA-KOOOOOM!! SHATTER!!



නාග පුරවරයේ විනාශය
ගඟ දිගේ ගොඩට ආපු මාර යක්ෂ හමුදාව නාග නගරය විනාශ කළා. අන්තිමට ඉතුරු වුණේ අළු ගොඩ මැද්දේ වැටිලා තිබුණු පොඩි දරුවෙක්ගේ ඔටුන්නක් විතරයි.


ගෝත්‍ර හයේ සමුළුව
රිටිගල කන්දේ ගිනි පන්දම් මැද්දේ ගෝත්‍ර හයේ නායකයෝ එකතු වුණා. පරණ තරහවල් මැද්දේ, යක්ෂ මහ ආරක්ෂකයා ඉස්සරහට ආවා.
මහ ආරක්ෂකයා
"අද ඉඳන් අපි වෙන වෙනම බෙදුණු ගෝත්‍ර හයක් නෙවෙයි..."



නාග රැජින වචනයක්වත් නොකියා අර දරුවාගේ පොඩි ඔටුන්න ගල් පුවරුව උඩින් තිබ්බා. ඒක දිහා බලාගෙන හිටපු යෝධ නායකයා නිහඬවම හිස පහත් කළා.


ගෝත්‍ර හයක් එකම දිවුරුමක්
ගෝත්‍ර හයේම අත් එකට එකතු වෙලා ඒ වෙස්මුහුණ උඩ තිබ්බා විතරයි, වෙස්මුහුණ නිල් පාටින් දිලිසෙන්න ගත්තා!
THOOM-IGNITE!!
මහ ආරක්ෂකයා
"...අපි හැමෝගෙම දුවන්නේ එකම ලේ. මේක අපි හැමෝගෙම සටනක්!"


තැනිතලාවේ මහා සටන
පහුවදා පාන්දරම, කඩාවැටුණු යානය ඉස්සරහා මාර හමුදාව කළු මුහුදක් වගේ තැනිතලාව පුරා පැතිරුණා.
මහ ආරක්ෂකයා
"අපේ මේ හෙළ බිම වෙනුවෙන්!"
ROOOOOAAAR!!



වෙස්මුහුණු දාගත්තු යක්ෂ සේනාව සන්නාහ දිලිසෙද්දි අකුණු සැරයක් වගේ පෙරමුණට කඩා පැන්නා!
THOOM! CLANG!!


KRA-SHHHH!!
නාග සෙබළු මහා වැව් බැම්ම කඩා දැම්මා, ගලාගෙන ආපු ජල කඳට මාර හමුදාවේ ඉස්සරහා පෙළම ගසාගෙන ගියා!


දේව දුනුවායෝ ගස් මුදුන්වල ඉඳන් එළිය විහිදෙන ඊතල වැස්සක් එව්වා!
කේතුමතී නමන්ගේ සැරයටිය උස්සලා රාක්ෂ ගිනි යන්ත්‍රවලින් ගිනි ජ්වලා මුදාහැරියා!
WHOOOMPH!!


මහා ගැටුම
නිල් පාටින් දිලිසෙන හෙල්ලය අතට ගත්තු මහ ආරක්ෂකයා සතුරු හමුදාව මැද්දටම පැන්නා!
මහ ආරක්ෂකයා
"උන්ගේ පෙළ බිඳපල්ලා!"
SHING-SLASH!!
CRAAAASH!!
කේතුමතී
"රාක්ෂ ගිනි බලයෙන් මේ හැම අඳුරු සෙවණැල්ලක්ම පුච්චලා දාන්න!"
BLAAAAM!!
දූපත වෙනුවෙන් සටන
දුම් වැදගත්තු තැනිතලාව පුරාම ජල කඳයි, ගිනි බලයයි, හෙළ අවියයි අහසින් වැටුණු මාරයෝ එක්ක කරට කර ගැටුණා!
KRA-THOOOOM!!


කණ්ණාඩි සංඥාව
කඳු මුදුනේ හිටපු මිනිස් ඔත්තුකාරයෝ ඉර එළියට ලෝකඩ කණ්ණාඩි අල්ලලා යක්ෂ සේනාවට සංඥා දුන්නා...
GLINT! CHIME!
ආරක්ෂක පෙළ බිඳෙයි
...ඒත් සාමාන්‍ය සතුරන්ට වඩා පස් ගුණයක් ලොකු මාර මෘගයෙක් මැද පෙළ කඩාගෙන පැන්නා! මහ ආරක්ෂකයා දූවිල්ල මැද්දේ විසිවෙලා ගියා.
SKRAAA-KOOM!!
BWWWOOOOOORN!!
යෝධයන්ගේ ආගමනය
එකපාරටම කඳුකරය දෙදරවමින් යුද හොරණෑවක් ඇහුණා! නැගෙනහිර ඉර එළිය මැදින් කඩා පැනපු යෝධ ගෝත්‍රය අර මාර මෘගයාව අතින්ම දෙකට ඉරලා දැම්මා!
KRA-RIPPP!!
KRA-KOOOOOM!!
අවසාන පහර
ගිනි ගන්නා යානය දිගේ දුවගෙන ගිය මහ ආරක්ෂකයා තමන්ගේ හෙල්ලය යානය මැද්දටම ඇන්නා! ඒ එක්කම තැනිතලාවේ හිටපු හැම මාරයෙක්ගෙම රතු හදවත් එකපාරටම නිවිලා ගියා.


පණ ගැහෙන එන්ජිම
යානය විනාශ වුණත්, ඒක ඇතුළේ තිබුණු රතු පාට 'හෘදය' එන්ජිම තවමත් පණ ගැහෙමින් අහසට සංඥා යවමින් තිබුණා.
THUMP-THUMP...
කේතුමතී
"අපි මේක විනාශ කළොත් උන් අනිවාර්යයෙන්ම ආපහු එනවා... ඒ නිසා අපි මේක ලව්වාම උන්ට බොරුවක් කියවමු."


නාගයෝ ඒ එන්ජිම පොළොව යට මහා ගුහාවකට ඇදගෙන ගියා...
යක්ෂයෝ පොඩි ගල් කණු තුනක තරු අකුරු කෙටුවා...
රාක්ෂයෝ කළු ගලේ සක්වල චක්‍රය කැටයම් කළා.



ආවරණය ක්‍රියාත්මක වෙයි
මහ ආරක්ෂකයා සක්වල ගල මැදට අත තිබ්බා විතරයි, නිල් සහ රන්වන් වළලු අහසට ඉස්සිලා ගල් කණු තුනට ආලෝක කදම්භ විහිදුණා!
HUMMMMMM!!


හාමුදුරුවන්ගේ හඬ
"අපි අපේ මුළු ලෝකයම... දඩයක්කාරයාගේ තරු අතරේ හැංගුවා."
ජීවිත පූජාව
"හැබැයි ඒ ආලෝකය බලගන්වන්න අපේ මිනිස්සු දහස් ගාණකගේ පණ පූජා කරන්න සිද්ධ වුණා."


මහ ආරක්ෂකයාගේ අනාවැකිය
"මතු දවසක මිනිස් රජවරු මේ ගල් කණු උඩ භක්තියේ මහා කඳු ගොඩනඟන දවසට... මේ ආරක්ෂක වැස්ම කවදාවත් බිඳෙන්නේ නෑ."
මහ ආරක්ෂකයා
"මේක පණ වගේ රැකගන්න."


අවුරුදු දහස් ගාණකට පස්සේ, එදා ඒ දරුවාගේ අතට දුන්නු වෙස්මුහුණම අද රිටිගල වනාන්තරයේදී නව්වාගේ අතේ තියෙනවා.
නව්වා
"භක්තියේ කඳු... ඒ කියන්නේ මහා දාගැබ් තුන!"


හාමුදුරුවෝ
"ඔය වෙස්මුහුණ පළවෙනි රජතුමාටත් වඩා පරණයි පුතේ... මුලින්ම ඒක පැළඳපු මහ ආරක්ෂකයාගේ ලේ තමයි අද ඔයාගේ ඇඟේ දුවන්නේ."
PULSE-GLOW!


TICK... TICK... TICK...
යක්කා පළමු මුද්‍රාව
රිටිගල අහසට උඩින් දඩයක්කාරයාගේ තරු තුන ආයෙමත් නිවී නිවී පත්තු වුණා... ඈත අභ්‍යවකාශයේ කවුරුහරි තවමත් අහගෙනයි ඉන්නේ.
පළමු කොටස නිමයි. දෙවන කොටසින් හමුවෙමු:
PART II, THE PACT OF RITIGALA